අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
உள்ளக அலுவல்கள், வடமேல் அபிவிருத்தி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
**Ministry of Internal Affairs, Wayamba Development & Cultural Affairs**
8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. 8 ஆம் மாடி, செத்சிரிபாய, பத்தரமுல்ல, ஸ்ரீ லங்கா.
8th Floor, Sethsiripaya, Battaramulla, Sri Lanka

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date

අභ්‍යන්තර කටයුතු චක්‍රලේඛ අංක: 01/2016

මාගේ අංකය:IA/1/1/4-II
අභ්‍යන්තර කටයුතු.වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
08 මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

2016.08.15

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
සහ
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතන ප්‍රධානීන්

<u>රාජකාරි ගමන් බලපත්‍ර නිකුත් කිරීම</u>

අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති අංක 02/2008 හා 2008.09.17 දින දරණ රාජකාරි ගමන් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ චක්‍රලේඛය අවලංගු කරන අතර ඒ වෙනුවට මෙම පහත දැක්වෙන නව විධිවිධාන 2016.08.15 දින සිට ක්‍රියාත්මක වේ.

02. රාජකාරි ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් ලබන නිලධාරීන්

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි අන්තර්ගත තනතුරු/ සේවා වර්ගීකරණය අනුව විධායක සේවා ගණයට අයත්වන සියළුම නිලධාරීන් එනම් SLI- 2006 වැටුප් කේතය හා ඉන් ඉහළ වැටුප් කේත යටතේ වැටුප් ලබන නිළධාරීන්.

II. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි තනතුරු වර්ගීකරණය අනුව විධායක ගණයට අයත් වන MM,AR,HM වැටුප් කේත සහ දැනට විශ්ව විද්‍යාලවලට අදාල වන වැටුප් කේත වන UEX2,UEX3,UAC3 හා ඉන් ඉහළ වැටුප් කේත යටතේ වැටුප් ලබන රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල, සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සහ විශ්වවිද්‍යාලවල නිලධාරීන්

III. ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ විධායක නිලධාරීන්

(අ) ශ්‍රී ලංකා යුධ හමුදාව - ලුතිතන් කර්නල් හා ඉහළ නිලධාරීන්
(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව - විංග් කොමන්ඩර් හා ඉහළ නිලධාරීන්
(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාව - කොමාන්ඩර් හා ඉහළ නිලධාරීන්
(ඈ) ශ්‍රී ලංකා පොලිසිය -සහකාර පොලිස් අධිකාරී නිලය හා ඉහළ නිලධාරීන්

IV. ගරු අමාත්‍යවරුන්ගේ
- පුද්ගලික ලේකම්.
- මාධ්‍ය ලේකම්
- සම්බන්ධීකරණ ලේකම්
- මහජන සම්බන්ධතා නිලධාරී
- උපදේශකවරුන් දෙදෙනෙක්

V. ගරු පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ගේ
- පුද්ගලික ලේකම්.
- මාධ්‍ය ලේකම්
- සම්බන්ධීකරණ ලේකම්
- මහජන සම්බන්ධතා නිලධාරී
-

VI. ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන් ,රාජ්‍ය අමාත්‍යවරුන්, ව්‍යාපෘති අමාත්‍යවරුන්, කැබිනට් නොවන අමාත්‍යවරුන්, පළාත් සභා අමාත්‍යවරුන් සහ පළාත් සභා සභාපතිවරුන් ගේ

- පුද්ගලික ලේකම්
- මාධ්‍ය ලේකම්
- සම්බන්ධීකරණ ලේකම්
- මහජන සම්බන්ධතා නිලධාරී

VII. පළාත් සභා මන්ත්‍රීවරු, මහ නගර සභා සහ නගර සභාවල නගරාධිපතිවරු

VIII. සියළුම ප්‍රාදේශීය සභාවල සභාපතිවරු

IX. දන්ත ධාතුන් වහන්සේගේ ගිහි භාරකාර ධූරය දරණ දළදා මාලිගාවේ දියවඩන නිළමේ හා අනෙකුත් ආගම් ත්‍රිත්වයේ ඒ හා සමාන ධූරය දරන්නන් (මෙහිදී අනෙකුත් ආගම් ත්‍රිත්වයේ ඒ හා සමාන ධූරයන් පිළිබඳව අදාල විෂය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු නිල විදේශ ගමන් බලපත් සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුවේ).

X. 1931 අංක 19 දරණ විහාර දේවාලගම් ආඥාපනත යටතේ පත්කරනු ලැබූ දේවාලයන්හි බස්නායක නිළමේවරු.

XI. විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නිර්දේශිත විදේශ දූත මණ්ඩල සේවය සඳහා නම් කරනු ලබන රාජ්‍යතාන්ත්‍රික නොවන තනතුරු දරණ නිලධාරීන්

XII. අභ්‍යන්තර පරිපාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන අත්‍යාවශ්‍ය හා විශේෂ රාජකාරී කටයුතු සඳහා විදේශගතවීමට අවශ්‍ය ඉහත කාණ්ඩවලට අයත් නොවන රාජ්‍ය නිලධාරීන්

XIII. ඉහත සඳහන් කාණ්ඩවලට අයත් නොවන කිසියම් රාජ්‍ය නිලධාරියකු සඳහා රාජකාරී ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා ඉල්ලුම් පත්‍රයක් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ විශේෂ නිර්දේශය සහිතව ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.එවැනි ඉල්ලීමක අඩංගු කරුණු අනුව රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කළ යුතු යැයි ආගමන හා විගමන පාලක ජනරාල් සෑහීමකට පත් වන්නේ නම් වසර (3) තුනක කාලයකට ලබා දිය යුතුය. එම කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම් නිර්දේශය ලබා ගත යුතුය. එක් රටකට හෝ රටවල් කිහිපයකට හෝ සීමා කළ රාජකාරී ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ඇත.

02. රාජකාරී (නිල) ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාල කොන්දේසි.

i. රාජකාරී ගමන් බලපත්‍රයක් සඳහා අයදුම්පත්‍රය මේ සමඟ ඇති ආකෘතියට අනුව සකස් කොට අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

ii. රාජකාරී ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට අදාල නිර්දේශය කරනු ලබන නිලධාරියා විසින් එය සම්පූර්ණ වගකීම දැරිය යුතුය.

iii. රාජකාරී ගමන් බලපත්‍ර ලබා දීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට බලයලත් නිලධාරීන්

| | |
|---|---|
| (අ) අමාත්‍යාංශ නිලධාරීන් සඳහා අමාත්‍ය / නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයද ඇතුළුව | - අමාත්‍යාංශ ලේකම්/ අතිරේක ලේකම් |
| (ආ) පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා | - ප්‍රධාන ලේකම් |
| (ඇ) දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා | - දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| (ඈ) රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අනුබද්ධිත ආයතනවල නිලධාරීන් සඳහා | - අමාත්‍යාංශයේ ලේකම් |
| (ඉ) පළාත් සභා මන්ත්‍රීවරු සඳහා | -ප්‍රධාන ලේකම්/ආණ්ඩුකාර ලේකම් |
| (ඊ) මහ නගරසභා/නගරසභාවල නගරාධිපතිවරු සඳහා | - අදාළ පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් |
| (උ) ප්‍රාදේශීය සභාවල සභාපතිවරු සඳහා | -අදාළ පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් |

03.රාජකාරි(නිල) ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන.

i. නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබූ අ.වි.35A අයදුම්පත

ii. අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා එහි ඡායා පිටපත

iii. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හා එහි ඡායා පිටපත

iv. අයදුම්කරු මීට පෙර ගමන් බලපත්‍රයක් / හදිසි සහතිකයක් / හඳුනා ගැනීමේ සහතිකයක් / ලබා ගෙන තිබේ නම් එම ගමන් ලියවිල්ල හා එහි දත්ත පිටුවේ ඡායා පිටපත

v. ඉල්ලුම්කරු මීට පෙර ලබා ගෙන තිබූ වලංගු ගමන් ලියවිල්ල අස්ථාන ගත වී ඇත්නම් ඒ බව සනාථ කිරීමට අදාලව පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලේ සහතික කළ පිටපත

vi. අමාත්‍යාංශ ලේකම්ගේ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය. (ඇමුණුම 01 ආකෘතිය අනුව)

vii. රාජකාරී ගමන් බලපත්‍රය අයදුම්කරන දිනට ආසන්නම මාසයේ වැටුප් විස්තරය හෝ විදේශ දූත මණ්ඩල සේවය සඳහා පත්කරන නිලධාරින් සඳහා විදේශ කටයුතු ලේකම් විසින් පත්වීම සනාථ කරමින් නිකුත් කරනු ලබන ලිපියක්

04. රාජකාරි(නිල) ගමන් බලපත්‍රවල වලංගු කාලය.

I. රාජකාරී ගමන් බලපත්‍රයක් සාමාන්‍යයෙන් වසර 10 ක වලංගු කාලයකට නිකුත් කෙරේ. එහිදී, දීපව්‍යාප්ත සේවාවන් සඳහා නිකුත් කළ දින සිට වසර 10 ක කාලයකට වලංගු වන පරිදි නිකුත් කරන අතර,(නිකුත් කරන දිනය හා ඉදිරි සේවා කාලය අනුව ගමන් බලපතෙහි වලංගු කාලය වෙනස් විය හැකිය) අනෙකුත් සේවාවන් සඳහා මුල් වරට නිකුත් කරනු ලබන රාජකාරී ගමන් බලපත්‍රයක් නිකුත් කළ දින සිට උපරිම වසර 05 වලංගු කාලයකට සීමා කෙරේ.නමුත් සේවා යෝජකයාගේ ඉල්ලීම මත වලංගු කාලය වසර 03 කට අඩු කිසියම් නිශ්චිත කාලයකට පමණක් වලංගු වන පරිදි සීමා කළ හැකිය. එවැනි සීමා කිරීමක් සහිත ගමන් බලපත්‍රයක එම සීමා සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම හෝ පිණිස දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය. (සෑම සංශෝධනයකදීම රාජකාරී ගමන් බලපත්‍රයේ වලංගු කාලය වසර 05 ක් නොඉක්මවිය යුතුය)

II. රාජකාරී ගමන් බලපත්‍ර ලබා දෙන අයගේ ලේඛනයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් දෛනිකව නඩත්තු කළයුතු වන අතර රාජකාරී ගමන් බලපත්‍රලාභීන්ගේ ගොනු වෙන වෙනම ලේඛනාගාරගත කළ යුතුය. සෑම වසරකම ජනවාරි 01 දිනට රාජකාරී ගමන් බලපත්‍රලාභීන් එම තනතුරු වල රැඳී සිටින බවට අදාල ආයතන ප්‍රධානීන්ගෙන් තහවුරු කොට ගෙන අවශ්‍ය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුය.

III. කිසියම් තනතුරකට පත් වීම නිසා රාජකාරී ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකම් ලබන අයෙකුට එම තනතුරු දරණ කාලයට පමණක් සීමා වන පරිදි රාජකාරී ගමන් බලපත්‍රයක් ලබා ගත හැකිය. එවැනි පුද්ගලයින් තනතුරු දරණ කාලය පිළිබඳ සැලකිළිමත් වීම රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කරන නිලධාරියාගේ වගකීමකි. උදා :- පළාත් සභා මන්ත්‍රීවරු, ශ්‍රී ලංකා විදේශ සේවය සඳහා යන රාජ්‍ය තාන්ත්‍රික නොවන නිලධාරීන්.

IV. රාජකාරී ගමන් බලපත්‍රයක් දරන්නෙකුට එය පාවිච්චි කළ හැක්කේ රාජකාරීමය විදේශ ගමන් සහ රාජකාරී නිවාඩු මත විදේශ රටවල අධ්‍යයන කටයුතු සඳහා පමණි. එසේ වුවද අදාළ තනතුරක හෝ සේවයට පත් වීමක් ලබා සිටින කාලය තුළ විධිමත් පරිදි විදේශ නිවාඩු අනුමත කරවා ගෙන අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අවසරය සහිතව මාස 03 කට අඩු පෞද්ගලික විදේශ ගමන් සඳහා ද රාජකාරී ගමන් බලපත්‍රය භාවිතා කළ හැකිය. මාස 03 කට වැඩි කාලයක් සඳහා පෞද්ගලික නිවාඩු මත විදේශ ගත වන්නේ නම් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතුය.

05 වෙනත් කරුණු

I. රාජකාරී ගමන් බලපත්‍රයක් විදේශයකදී රැකියාවක් කිරීම පිණිස වලංගු නොවන අතර ඒ බව ගමන් බලපත්‍රයේ තැබෙන පිටසනක් / මුද්‍රාවක් මඟින් සඳහන් කරනු ලැබේ.

II. රාජකාරී ගමන් බලපත්‍රයක් දරන්නෙකු වැටුප් රහිත නිවාඩු ලබා විදේශ රැකියාවකට යන විට තම රාජකාරී ගමන් බලපත්‍රය ආගමන හා විගමන පාලක ජනරාල් වෙත ඉදිරිපත් කොට එය අවලංගු කරවා ගෙන සාමාන්‍ය ගමන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

III. දැනටමත් සාමාන්‍ය ගමන් බලපත්‍රයක් ලබා ගෙන ඇති අයෙකුට ඉහත අංක "02 ඡේදයේ" අවශ්‍යතා සපුරාලමින් එය ආගමන හා විගමන පාලක ජනරාල් වෙත භාර දී රාජකාරී ගමන් බලපත්‍රයක් ලබා ගැනීමට හෝ නිලධාරියාගේ කැමැත්ත පරිදි රාජකාරී පිටසනක් ලබා ගෙන තම සාමාන්‍ය ගමන් බලපත්‍රයම රාජකාරී ගමන් සඳහා ද භාවිතා කළ හැකිය.

IV. වලංගු රාජකාරී ගමන් බලපත්‍රයක් දරන්නෙකු සේවයෙන් විශ්‍රාම ගන්නා විට, ධූර කාලය අවසන් වන විට හෝ සේවයෙන් ඉල්ලා අස් වූ විට හෝ වැඩ තහනමට ලක්ව සිටින විට තම ගමන් බලපත්‍රය අදාල අමාත්‍යාංශයේ / පළාත් සභාවේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා වෙත භාර දිය යුතුය. එසේ ලබා ගන්නා රාජකාරී ගමන් බලපත්‍ර ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කොට අවලංගු කරවා අදාල පුද්ගලයාට භාර දිය යුතුය.නොඑසේනම් උක්ත ආයතන වල ප්‍රධානීන් එම අයගේ රාජකාරී ගමන් බලපත්‍ර තම භාරයට ගැනීමට කටයුතු කළ යුතුය. උක්ත හේතූන් මත සේවයේ නොයෙදෙන රාජකාරී ගමන් බලපතක් දරන්නෙකු තම ගමන් බලපත්‍රය ආයතන ප්‍රධානියාට ඉදිරිපත් නොකරන්නේ නම් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් එම රාජකාරී ගමන් බලපත්‍රය අවලංගු කිරීම සඳහා ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතුය.

V. රාජකාරී ගමන් බලපත්‍රයක් නැති වූ විට සාමාන්‍ය ගමන් බලපත්‍රයක් සම්බන්ධයෙන් ක්‍රියා කරන පරිදි ආසන්නතම පොලිස් ස්ථානයේ ඒ බව සටහන් කොට, තම ආයතන ප්‍රධානියා මඟින් ආගමන හා විගමන පාලක ජනරාල් වෙත දැනුම් දී එම ගමන් බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු සැලසිය යුතුය.

VI. රාජකාරී ගමන් බලපත්‍රයක් දැරීම නිසා විදේශ ගමන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන, භාණ්ඩාගාර චක්‍රලේඛ හෝ ආයතන වල චක්‍රලේඛ හෝ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුගමනය කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීමට අවකාශ නොසැලසේ.

06. සියළු අමාත්‍යාංශ ලේකම්වරු/ආයතන ප්‍රධානීන් විසින් රාජකාරී ගමන් බලපත්‍ර නිකුත් කිරීම්, ලේඛණගත කර අදාල තනතුර/ධූරය අවසන් වූ වහාම ආගමන විගමන පාලක ජනරාල් වෙත දැනුම් දිය යුතුය.

07. ඉහත උපදෙස් වලට අනුකූල නොවන ආකාරයේ රාජකාරී ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීම හෝ අයුතු ලෙස පරිහරණය කිරීම කලින් කළ සංශෝධනය කරන ලද 1948 අංක 20 දරණ ආගමික හා විගාමික පනතේ 45 වගන්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වේ.

08. මෙම චක්‍රලේඛය වලංගු වන 2016.08.15 දින වන විට මෙම චක්‍රලේඛයට පරිබාහිරව නිකුත් කරන ලද සියළුම රාජකාරී ගමන් බලපත්‍ර අවලංගු කිරීමට ආගමන හා විගමන පාලක ජනරාල් පියවර ගත යුතුය.

ඔබ අමාත්‍යාංශය / පළාත් සභාව යටතේ ඇති සියළුම ආයතනවල ප්‍රධානීන් හා නිලධාරීන් වෙත මෙම උපදෙස දැන ගැනීමට සලස්වනු මැනව.

ඩී.ස්වර්ණපාල
ලේකම්
අභ්‍යන්තර කටයුතු,වයඹ සංවර්ධන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. ආගමන හා විගමන පාලක ජනරාල්

ඇමුණුම 01

## <u>රාජකාරී(නිල) ගමන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ආයතන ප්‍රධානියාගේ / අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය.</u>

01. ඉල්ලුම් කරුගේ නම ..........................................................................................
..........................................................................................

02. ඔහුගේ / ඇයගේ තනතුර හා:- ..........................................................................................
එම තනතුරට පත් වූ දිනය ..........................................................................................

03. අයදුම්කරු අයත් සේවාව හා.:- ..........................................................................................
එම සේවාවට පත් වූ දිනය ..........................................................................................

04. රාජකාරී ගමන් බලපත්‍රයක්:- ..........................................................................................
අවශ්‍ය කාරණය

05. ගමන් බලපත්‍රය වලංගු විය යුතු කාලසීමාව:- ..........................................................................................

06. අයදුම්කරුගේ පුද්ගලික ලිපිනය:- ..........................................................................................
(ලිපිනය වෙනස් වුවහොත් ..........................................................................................
දැන්විය යුතුය)

07. අයදුම්කරුගේ දුරකථන අංක :-

රාජකාරී :- ..........................................................................................

නිවස :- ..........................................................................................

ජංගම :- ..........................................................................................

ඉහත සඳහන් සියළු තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, අයදුම්කරුට / අයදුම්කාරිනියට රාජකාරී ගමන් බලපත්‍රයක් ලබා දීම නිර්දේශ කරමි. / නොකරමි.

.......................................... ..........................................................................

දිනය අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා